වැලිගෙපොල ප්‍රාදේශීය සභාව

රත්නපුර දිස්ත්‍රික්කය

01. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 08 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 මැයි 23 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට වැලිගෙපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරණු ලැබේ.

(අ) චෙක්පත් අහරු වූ විට එම වටිනාකම නැවත අයකර ගන්නා තෙක් අහරු චෙක්පත් ගිණුමට හර කල යුතු වුවත්, රු. 133,400 ක් වටිනාකමැති අහරු චෙක්පත අත්තිකාරම් ලෙස සලකා ගිණුම්ගත කර තිබුණි.

(ආ) අය විෂයය අංක 2.13 කසල බදු අය ශීර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂය තුලදී ලද රු. 144,000 ක්වූ ආදායම බිල් කිරීම් ලෙස ගිණුම්ගත කල යුතු වුවත් රු. 95,500 ක් පමණක් ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ ආදායම රු. 48,500 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවීමට නොහැකි වූ රු. 85,814 ක වියදම් අදාල වැය ශීර්ෂයට හා ණයහිමියන්ට ගැලපීමෙන් තොරව 2016 වර්ෂයේ වියදමට ගලපා තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේ වියදම හා වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2009 සිට 2014 වර්ෂයන්ට අදාලව ගෙවීමට නොහැකි වූ එකතුව රු. 768,849 ක්වූ වියදම් අදාල වර්ෂයන් තුලදී ණයහිමියන්ට වෙන් කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට හර කර තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලද රු. 20,881,461 ක් වටිනාකමැති වත්කම් පරිත්‍යාග සංචිත වශයෙන් අදාල වත්කම් ගිණුම් වල ගිණුම්ගත කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

----------------------------

ගිණුම් විෂයයන් 03 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛණ අනුව ශේෂයන් අතර රු. 736,209 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 නීති රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

1988 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා නිකුත් කරන ලද එකතුව රු. 2,485,572 ක අත්තිකාරම් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371(2) නියමය නිරවුල් කර පරිදි ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 4,188,432 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 3,305,066 ක් විය.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය මෙහෙයුම් අතිරික්තය රු. 883,366 කින් වැඩිවී තිබූ අතර, එය පසුගිය වර්ෂයට වඩා සියයට 26.73 ක වැඩිවීමක් බව නිරීක්ෂණය විය. මෙයට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු, බදුකුලී, බලපත්‍ර ගාස්තු, දඩ හා වරෙන්තු ගාස්තු හා වෙනත් ආදායම් වල පිළිවෙලින් සියයට 07, සියයට 70, සියයට 40, සියයට 29 හා සියයට 36 ක වැඩිවීම හා සැපයුම් හා උපකරණ සහ ප්‍රවාහන සම්බන්ධතා වල සියයට 28 සහ සියයට 10 ක අඩුවීමකි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' |
| වරිපනම් හා බදු | 3,508 | 7,219 | 4,411 |
| බදු කුලී | 1,169 | 1,476 | 73 |
| බලපත්‍ර ගාස්තු | 731 | 1,203 | 58 |
| වෙනත් ආදායම් | 55,470 | 35,054 | 6,196 |

2.3.2. ආදායම් රැස්කිරීමේ කාර්යයසාධනය

------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරෙන්තු හා දඩ සහ වෙනත් ආදායම් යන ආදායම් විෂයයන් රැස්කල ආදායම, අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 49 හා සියයට 45 ක අඩුවීමක් පෙන්නුම් කෙරිණි.

2.3.3 වරිපනම් බදු

-----------

(අ) 2015 සැප්තැම්බර් 30 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු. 2,437,106 ක්වූ අතර, එයින් රු. 5,000 ට වඩා වැඩි හිඟයක් පවතින වරිපනම් බදු ඒකක 40 කින් රු. 276,412 ක් අයවිය යුතු අතර, එය මුළු හිඟ වටිනාකමින් 11% ක් පමණ විය.

(ආ) 2014 ජනවාරි 01 දින සිට දියුණු ගම් ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කල ගම්මාන 09 ක වරිපනම් බදු තක්සේරු කර තිබූ නමුත් එකී ප්‍රදේශ සඳහා සභාව මඟින් සපයන පහසුකම් ප්‍රමාණවත් නොවන බවට වන ප්‍රදේශ වාසීන්ගේ ඉල්ලීම සලකා බලා විෂයයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සභා තීරණයක් අනුව එම ප්‍රදේශ වල වරිපනම් බදු කපාහැර තිබුණි. ඒ අනුව 2015 සැප්තැම්බර් 30 දිනට එම ප්‍රදේශ වලින් රු. 901,602 ක වරිපනම් බදු ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

2.3.4 වෙනත් ආදායම්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක් සතිපොලක හා මාළු ලැලි 02 ක 2009 වර්ෂයේ සිට රු. 16,178 ක හිඟ ශේෂයක් පැවතියද එම හිඟ මුදල පියවා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු සතිපොල හා මාළු ලැලි බදු දීමේදී වර්ෂ කිහිපයක සිට පුවත්පත් මඟින් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම් සිදු කිරීමෙන් තොරව සීමිත මිල කැඳවීම් පමණක් සිදුකර තිබූ අතර, මෙකී දේපල වල ටෙන්ඩර් වටිනාකමද වර්ෂ කිහිපයක සිට ඉතා අඩු වටිනාකමින් පමණක් ඉහල යන බවද, ඉහල තරඟකාරීත්වයක් ලබාදී ඉහල වටිනාකමින් දේපල බදු ලබා දීමට තිබූ හැකියාව සභාව විසින් අහිමි කරගෙන තිබූ බවද විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) ඕපනායක පොදු වෙළඳපල අංක 01 සිට 08 දක්වා වන කඩකාමර 1996 වර්ෂයේදී මාසික බදු කුලිය රු. 300 ක් ලෙස තීරණය කර බදු දී තිබූ නමුත් කිසිඳු තක්සේරුවකින් තොරව 2007 වර්ෂයේදී රු. 600 දක්වා බදු කුලිය වැඩිකර තිබුණි. මේ අනුව බදු මුදල් තක්සේරු කිරීමකින් අනතුරුව තීරණය කිරීම සඳහා කටයුතු කර නොතිබූ අතර, රු. 600 දක්වා වැඩි කරන ලද මාසික බදු කුලී සංශෝධනය ඇතුලත් කර ගිවිසුමකට එළඹීමටද කටයුතු කර නොතිබුණි.

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 සිට ජූලි 30 දින දක්වා ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණය වෙතින් ලැබිය යුතු උසාවි දඩ මුදල් රු. 163,541 කට අදාලව උප ලේඛණ ගෙන්වා ගෙන තිබූ නමුත් එම මුදල් අයකර ගැනීමේ ප්‍රමාදයක් දක්නට තිබුණි. තවද, ඇඹිලිපිටිය මහේස්ත්‍රාත් අධිකරණයෙන් සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට හා බලංගොඩ මහේස්ත්‍රාත් අධිකරණයෙන් සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් සිට උසාවි දඩ හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් මඟින් ලැබිය යුතු මුද්දර ගාස්තු උප ලේඛණ ගෙන්වා ගෙන එම මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.3.6 වෙළඳ බලපත්‍ර ගාස්තු

-------------------------

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසය වනවිටද වෙළඳ බලපත්‍ර ලබා ගතයුතු ආයතන 82 කින් වෙළඳ බලපත්‍ර ලබාගෙන නොතිබූ බවද, 2015 වර්ෂයේදී වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු බලපත්‍ර නිකුත් කර තිබූ ආයතන 62 ක වාර්ෂික ආදායම් තක්සේරුව සිදු කිරීමෙන් තොරව වෙළඳ බලපත්‍ර වටිනාකම තීරණය කර තිබුණි. වෙළඳ බලපත්‍ර මුද්‍රිත කුවිතාන්සි සහිත පොතේ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලියා තිබූ ව්‍යාපාර 35 ක් සඳහා වන වෙළඳ බලපත්‍ර විගණිත දිනය වූ 2015 දෙසැම්බර් 18 දින දක්වාම එකී ආයතන වෙත නිකුත් කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය
------------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

හංකානිවත්ත හන්දිය සිට ඕපනායක දක්වා වන කිලෝමීටර් 03 ක් පමණ වන ප්‍රධාන මාර්ගයෙහි අඩි 80 ත් 100 ත් අතර පරතරයකින් යුතුව මෙම වොට් 250 අධිවෝල්ටීයතාවයෙන් යුතු ක්‍රෝබා කට්ටල 49 ක් ස්ථාපිත කර තිබුණි. මේ පිළිබඳව කහවත්ත විදුලි ඉංජිනේරු විසින් කරන ලද ලිඛිත දැනුම්දීමට අනුව විදුලි බල මණ්ඩලයේ අවසරයකින් තොරව අධිධාරිතාවයෙන් යුතු විදුලි බුබුළු විදුලි පද්ධතියට එකතු කිරීම මඟින් ප්‍රදේශයේ පිහිටුවා ඇති තාරාපැව් (ට්‍රාන්ස්ෆෝමර්) 06 ක් අධිබැරවී පිළිස්සී යාමේ අවධානමකට ලක්ව තිබුණි.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය
----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ)(I) රජය මඟින් ක්‍රියාත්මක කරන ලද "දොරින් දොරට ගමින් ගමට" වැඩසටහන යටතේ සභාව විසින් ක්‍රියාත්මක කර වැඩ අවසන් කරන ලද කර්මාන්ත 06 කට අදාලව රු. 8,960,000 ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු වුවත් එකී මුදල් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වනවිටත් ගෙවා නොතිබූ අතර එකී වැඩසටහන යටතේ වැඩ ආරම්භ කරන ලද රු. 9,959,770 ක් වටිනාකමැති කර්මාන්ත 05 ක් ද විගණිත දිනය වනවිට වැඩ අතරමඟ නවතා දමා තිබුණි.

(II) තවද, කර්මාන්ත 05 කට අදාලව අත්තිකාරම් ලෙස ලැබී තිබූ රු. 1,694,488 ක අත්තිකාරම් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබූ නමුත් , ඉන් කර්මාන්ත 04 ක් විගණිත දිනය වනවිටත් වැඩ නතර කර තිබුණි.

(ආ) 2015 ජූලි 07 දින මාස 03 ක කාලයක් සඳහා රු. 490,196 ක පිරිවැයකට ගිවිසුම්ගතව තිබූ පළාත් සභා ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල මාදොල උසාවි වත්ත ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම කර්මාන්තය සඳහා විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2015 දෙසැම්බර් 22 දින වනවිට භූමියේ පස් කපා දමා භූමියේ තැනින් තැන මඩ වලවල් සෑදී තිබූ බවත්, ක්‍රීඩා භූමිය කෙළවරේ අනාරක්ෂිත විදුලි රැහැන් ඇද දමා තිබූ බවත්, ගිවිසුම් කාලය අවසන් වී මාස 04 කටත් වැඩි කාලයක් ගතවී තිබුණද, කර්මාන්තය සම්පූර්ණ කර නොතිබූ බවත් විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) ගිවිසුම්ගත වටිනාකම රු. 1,770,000 ක්වූ හා රු. 394,000 ක අත්තිකාරම් මුදලක් ලබාදී තිබූ දකුණු හුණුවල පාලම අසල සිට පහලවෙල මාර්ගය තාර දමා සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා අඟල් 04 ගල් යොදා තිබියදී දැඩි වර්ෂාව හේතුවෙන් උක්ත මාර්ගය ගංවතුරට ගසාගෙන ගොස් තිබුණු බව 2014

ඔක්තෝම්බර් 3 දින කරන ලද භෞතික පරික්ෂාවේදී අනාවරණය විය. නමුත් විගණිත දිනය වූ 2015 දෙසැම්බර් 22 දින වනවිටත් එකී කර්මාන්තය නැවත පිළිසකර කිරීම සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

----------------------------

නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

සභාව සතු අංක LF – 4847 දරණ මහේන්ද්‍රා කැබ් රථය හා අංක 53 – 5637 දරණ ඩබල් කැබ් රථය භාවිතයට ගත නොහැකි මට්ටමට අබලන් වී ඇතත්, විගණිත දිනය වනවිටත් අළුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබූ බැවින්ද, අංක RC – 6945, RA – 7230 හා 270 – 2930 දරණ ට්‍රැක්ටර් රථ තුන අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි වුවද එම අලුත්වැඩියාවන් නිසි පරිදි සිදු නොකිරීම මතද මෙකී වාහන සභා පරිශ්‍රය තුල නිශ්කාර්යයව ගාල් කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.4 අවිධිමත් ගණුදෙණු

----------------------

(අ) මල්මී කන්ද ජල ව්‍යාපෘතිය ඍජු ශ්‍රම පදනම මත ක්‍රියාත්මක කර තිබූ අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව මිල අඩුම ආයතනය මඟින් කිසිඳු අනුමැතියකින් තොරව හා තාක්ෂණික ඇගයීමකින්ද තොරව තත්ත්ව වාර්තාවක් හෝ ලබා නොගෙන ජල මීටර් 300 ක් ඇතුළු ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2014 වර්ෂයේදී රු. 1,368,975 ක් වැයකර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදීද රු. 445,000 ක වියදමක් ඒ සඳහා දරා තිබුණි.

(ආ) විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති චක්‍රලේඛය මඟින් වීථි ආලෝකකරණය සම්බන්ධයෙන් වන උපදෙස් පිළිබඳව නොසලකා රු. 810,000 ක් වටිනාකමැති වොට් 250 ක්‍රෝබා වර්ගයේ වීථි පහන් සෙට් 70 ක් හා වොට් 125 ක්‍රෝබා වීථි පහන් 15 ක් තාක්ෂණික නිලධාරීගේ නිර්දේශය හෝ සභා අනුමැතියකින් තොරව හා ටෙන්ඩර් ක්‍රියාපටිපාටියකින් තොරව මිලදී ගෙන තිබුණි.

04. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය.

-----------------------------------------

4.1 අයවැය පාලනය.

-------------------

වැය විෂයයන් 27 කට අදාලව රු. 2,029,492 ක මුළු ප්‍රතිපාදන කිසිඳු කාර්යයක නොයොදා නොතිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම
-----------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

05. පද්ධති හා පාලනය
-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය